# මහා සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව

## 2022 ජූනි 23 වන දින

❖ 08 වන සැසි වාරයේ 50 වන සභා වාර්තාව

දිනය :- 2022.06.23 වන දින

වේලාව :- පෙ.ව.10.00

ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙණිය

**පැමිණීම**

| | |
|---|---|
| 01. ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා | පෙ.ව. 10.00 |
| 02. ගරු ප්‍රා.ස.ම. යූ.පී.ධර්මසිරි මැතිතුමා | පෙ.ව. 10.00 |
| 03. ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව. 10.00 |
| 04. ගරු ප්‍රා. ස. ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා | පෙ.ව. 10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම. එම්.පී.සී.කැලුම් කුමාර ගරුසිංහ මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 08. ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත ජයලත් මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම. එම්.ඩී. සුගතදාස මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 10. ගරු ප්‍රා.ස.ම. ජී.පී. නිශාන්ත කුමාර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 11.ගරු ප්‍රා.ස.ම. මාහෙල් දිසානායක මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම. ටී.සී. ඉන්දික මැතිතුමා | පෙ.ව. 10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම. ඩබ්.ජී. සංජීව මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 14. ගරු ප්‍රා.ස.ම. එන්.ජී.එස්. වීරසිරි මැතිතුමිය. | පෙ.ව. 10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ජිනනායක මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම. ඩී.රාජපක්ෂ මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 17. ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ ආනන්ද කුලසුන්දර මැතිතුමා. | පෙ.ව. 10.00 |
| 19. ගරු ප්‍රා.ස.ම. කේ.කේ.ජී.සුමෛත්‍රා මැතිතුමිය | පෙ.ව. 10.00 |
| 20. ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව. 10.00 |

21. ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා පෙ.ව. 10.00

22. ගරු ප්‍රා.ස.ම. පී.එන්.එස්. ගුණවර්ධන මැතිතුමිය. පෙ.ව. 10.00

23. ගරු ප්‍රා.ස.ම. අයි.කේ. සුසන්ත පත්ම තිලක් මැතිතුමා. පෙ.ව. 10.00

නොපැමිණීම

01. ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා

02. ගරු ප්‍රා.ස.ම. කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා

03. ගරු ප්‍රා.ස.ම. කේ. රන්ජන් වීරසේකර මැතිතුමා.

04. ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා.

05. ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය.

06. ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ප්‍රදීපා නියංසලා මැතිතුමිය.

සහභාගී වූ නිලධාරින්

01. ලේකම (වැ.බ) - එම්.දිනුජිත් රන්දූල මයා.

02. කළමනාකරණ සේවා නිළධාරි - චන්ද්‍රලේඛා ජයවික්‍රම මිය

ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම.

ගරු සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගි වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදෑසනක්. සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂයේ ජුනි මස මහ සභා රැස්වීම සඳහා සහභාගි වන ගරු හිටපු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගි වූ ලේකම් තුමා ඇතුළු නිලධාරීතුමියක් ඉතාමක් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

01.පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.

2022 මැයි මස 24 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සළකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත් ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ම.ජේ.ඒ.ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා

නිහඬතාවයෙන් පෙනී යන්නේ පසුගිය සභා වාර්තාවේ සංශෝධන නොමැති බවයි. ඒ අනුව සංශෝධන රහිත වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ජී.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මැයි 24 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සම්බන්ධව විරෝධතා නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත**

**03. ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති සංදේශ ,පෙත්සම් ,පැමිණිලි හා සන්නිවේදන - නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**05 – 1. එගොඩබැද්ද සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉදිකිරීමක් සම්බන්ධවයි**

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

එගොඩබැද්ද සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඉදි කිරීමක් සම්බන්ධවයි මැයෙන් වලස්මුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරිතුමන්ගේ අංක WA/ MOH/ DO/පොදු හා 2022.05.27 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව එම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සිවිලිම සකස් කර ගැනීම සහ සායන සඳහා පැමිණෙන මව්වරුන්ට අසුන් ගැනීම සඳහා ආසන සකස් කර ගැනීම සිදු කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව 2022 අයවැය ප්‍රතිපාදන මගින් එම කටයුතු සඳහා වෙන් කරන ලද මුදලින් තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත එම කටයුතු සිදුකිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම.ආර්යරත්න ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමණි, මෙවැනි ප්‍රතිසංස්කරණයන් සඳහා මධ්‍යම ආණ්ඩුවෙන් හෝ පළාත් සභා මගින් ප්‍රතිපාදන ලබා දෙන්නේ නැද්ද? අපිට සභා අරමුදලින් මේ දේවල් කරන්න පුළුවන්ද?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අපේ මූලික අරමුණක් තමයි මහජන සෞඛ්‍ය නගා සිටුවීම. ඒ නිසා අපි සෞඛ්‍ය අංශයේ වැඩ කටයුතු සඳහා අයවැයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන තියෙනවා. එම ප්‍රතිපාදන මගින් අපේ තාක්ෂණ නිළධාරීන් ලවා වාර්තාවක් සකස් කරලා මේ ප්‍රතිසංස්කරණ කටයුත්ත කරලා දෙමු.

ඒ අනුව එගොඩබැද්ද සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සිවිලිම සකස් කර ගැනීම සහ සායන සඳහා පැමිණෙන මව්වරුන්ට අසුන් ගැනීම සඳහා ආසන සකස් කර ගැනීම සඳහා සිදු කර ඇති ඉල්ලීම අනුව 2022 අයවැය ප්‍රතිපාදන මගින් ඒ සඳහා වෙන් කරන ලද මුදලින් තාක්ෂණ නිළධාරි වාර්තාවක් මත එම කටයුතු සිදුකිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 2. අතුරු මාර්ග කිහිපයක් මෝටර් ග්‍රේඩර් කර ගැනීම සම්බන්ධව

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

අතුරු මාර්ග කිහිපයක් මෝටර් ග්‍රේඩර් කර ගැනීම සම්බන්ධවයි මැයෙන් කිරම, බින්තැන්න, සුබෝධා ලිපිනයෙහි පදිංචි ඩී.පියතිස්ස මයා විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව බින්තැන්න ග්‍රාම නිළධාරි වසමේ පිහිටි මාර්ග කොටස් කිහිපයක් මෝටර් ග්‍රේඩර් කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව ඉදිරියේදී ඉන්ධන ගැටළුව යථා තත්වයට පත්වූ පසුව එම මාර්ග සංවර්ධනය සඳහා තාක්ෂණ නිළධාරි නිර්දේශය මත සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සහ බැකෝ යන්ත්‍රය ලබා දීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

මෙහිදී තියෙන ගැටළුව තමයි අපිට ඉන්ධන නැතිකම . එය යථා තත්වයට පත් වූ පසුව අපි මේ කාර්යයන් සිදු කරලා දෙමු. අපේ අත්‍යාවශ්‍යම කාර්යයක් වන කසළ එකතු කිරීමට ට්‍රැක්ටර් වලට පවා තෙල් ගන්න විදියක් නැහැ. ඒත් එක්කම නිළධාරින්ට එන්න විදියක් නැහැ. ඒ අයට තෙල් ලැබෙන්නේ නැහැ. ඉදිරියේදී මේ සඳහා යම් ක්‍රමවේදයක් සකස් කරාවී.

ඒ අනුව අතුරු මාර්ග කිහිපයක් මෝටර් ග්‍රේඩර් කර ගැනීම සම්බන්ධවයි මැයෙන් කිරම, බින්තැන්න, සුබෝධා ලිපිනයෙහි පදිංචි ඩී.පියතිස්ස මයා විසින් සිදු කර ඇති ඉල්ලීමට අනුව බින්තැන්න ග්‍රාම නිළධාරි වසමේ පිහිටි මාර්ග කොටස් කිහිපයක් මෝටර් ග්‍රේඩර් කර ගැනීම සඳහා කර ඇති ඉල්ලීමට අනුව ඉදිරියේදී ඉන්ධන ගැටළුව යථා තත්වයට පත්වූ පසුව එම මාර්ග සංවර්ධනය සඳහා තාක්ෂන නිළධාරි නිර්දේශය මත සභාව සතු මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය සහ බැකෝ යන්ත්‍රය ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා වාර්තා

### 06 – 1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව -2022.06.10 වන දින

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022.06.10 වන දින පැවති මුදල් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අංක 01 සිට 95 දක්වා වූ වවුචර් සඳහා ගෙවීම කිරීම සුදුසු බවත් අංක 01 සිට 06 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල(රු) |
|---|---|---|---|
| 1. | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 9230.00 |
| 2. | කේ.සී.සංජීව මයා,සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2000.00 |
| 3. | එන්.එන්.වීරක්කොඩි මිය, සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1140.00 |

| | | | |
|---|---|---|---|
| 4. | එච්.ඒ.චමින්ද වික්‍රමසිංහ මයා, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1808.00 |
| 5. | ඒ.වී.පී.යමුනා නිල්මිණී මිය, සංවර්ධන නිලධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 2780.00 |
| 6. | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම | 1050.00 |
| 7. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 අප්‍රේල් මස වරාපිටිය මහජන පුස්තකාලයට සපයන ලද පුවත්පත් බිල ගෙවීම | 7720.00 |
| 8. | එන්.පී.ස්වර්ණා මිය,පුවත්පත් නියෝජිත,කිරම | 2022 අප්‍රේල් මස කිරම මහජන පුස්තකාලයට සපයන ලද පුවත්පත් බිල ගෙවීම | 7300.00 |
| 9. | එම්.ඒ.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 පෙබරවාරි මස ගමන් වියදම් ගෙවීම | 576.00 |
| 10 | එම්.ඒ.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස ගමන් වියදම් ගෙවීම | 890.00 |
| 11 | එම්.ඒ.සාගරිකා මිය,කාර්යාල කාර්ය සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස ගමන් වියදම් ගෙවීම | 612.00 |
| 12 | ආරියරත්න මුතුකුමාරණ මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 1695.00 |
| 13 | කේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 3828.00 |
| 14 | ජී.ඒ.රංජිත් මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස අතිකාල දීමනා ගෙවීම | 2736.00 |
| 15 | දිමුතු තුරංග මයා,ජල සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 13837.00 |
| 16 | සරත් ලියනගේ මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 13270.00 |
| 17 | ජේ.එස්.චන්ද්‍රසිරි මයා,මාර්ග කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 15870.00 |
| 18 | ආරියරත්න මුතුකුමාරණ මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 7710.00 |
| 19 | රෝහිත ඩිල්ෂාන් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 1155.00 |
| 20 | එම්.අමර හේරත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 2844.00 |
| 21 | ගයාන් සමන්ත මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 2311.00 |
| 22 | අමිල සම්පත් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 3081.00 |
| 23 | කේ.කේ.ආනන්ද මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 3536.00 |
| 24 | ආර්.සංජීව මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 1818.00 |
| 25 | කේ.රූපසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 8500.00 |

| | | | |
|---|---|---|---|
| 26 | සුජ්පා වඩිවෙල් මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 9250.00 |
| 27 | ජේ.වී.පතිනායක මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 8750.00 |
| 28 | අයි.ජී.මංජුල මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 29 | ජේ.ජේ.නාලක මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 3540.00 |
| 30 | ජී.ඒ.රංජිත් මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 7977.00 |
| 31 | ප්‍රියන්ත ඒකනායක මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 9136.00 |
| 32 | ජේ.වී.එම්.රුවීර ප්‍රියංකර මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 8905.00 |
| 33 | ඒ.ජේ.ඒ.ක්‍රිෂාන්ත මයා, රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 11004.00 |
| 34 | ජී.එම්.නිහාල් චමින්ද මයා,මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 16563.00 |
| 35 | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා, මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 16406.00 |
| 36 | එස්.ජේ.ඒ.ගුණරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 4706.00 |
| 37 | ප්‍රභාත් ජානක සම්පත් මයා,ආදේශක මුරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 8032.00 |
| 38 | සමීර සම්පත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 4185.00 |
| 39 | රොෂාන් ඉන්ද්‍රජිත් මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 11395.00 |
| 40 | එස්.වසන්ත කුමාර මයා, වැඩ ක්ෂේත්‍ර කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 10912.00 |
| 41 | කුමාර පලිහක්කාර මයා,බැකෝ සහයක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 6428.00 |
| 42 | ජේ.ජී.සුජිත් මයා,විදුලි කාර්මික, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 4534.00 |
| 43 | එස්.ජේ.චන්දන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 6222.00 |
| 44 | බී.දයාසේන මයා, සෞඛ්‍ය කම්කරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 6615.00 |
| 45 | ජේ.එච්.සේනාරත්න මයා,රියදුරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස අතිකාල දීමනා ගෙවීම | 4804.00 |
| 46 | සාමාන්‍යාධිකාරී,ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය,නුපේ,මාතර | මිද්දෙනිය උතුර නව නල ළිඳ ඉදිකිරීම සඳහා හිඟ මුදල් ගෙවීම | 40683.60 |
| 47 | සී/ස ගුණවර්ධන සහ (පුද්) සමාගම,මහ විදිය,අම්බලන්තොට | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය කාර්යාලීය උපකරණ හා ලිපි ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 44650.00 |
| 48 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 12730.00 |

| | | | |
|---|---|---|---|
| 49 | එම්.චම්පිකා චතුරාණි මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 3000.00 |
| 50 | එස්.දුෂාන්ති මිය, ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් | 2780.00 |
| 51 | ඩී.ජී.ශාලා පද්මලතා මිය,සැලසුම් නිළධාරී,නාගරික සංවර්ධන අධිකාරිය | 2022මාර්තු මස ගමන් වියදම් | 1261.00 |
| 52 | ආර්.එම්.එස්.කේ.ආරියසේන මයා,තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් | 5250.00 |
| 53 | කේ.ජී.ටී.හර්ෂණී මෙය,තාක්ෂණික සේවා නිළධාරී, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් | 5250.00 |
| 54 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 5000.00 |
| 55 | ආර්.ජී.නුවන් ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11318.25 |
| 56 | අයි.සුනිල් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11318.25 |
| 57 | කීර්ති අබේනායක මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11318.25 |
| 58 | ජේ.ඒ.රංජිත් මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 11318.25 |
| 59 | කේ.කේ.ඉන්දික මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 3285.00 |
| 60 | එම්.ඒ.චමින්ද කුමාර මයා, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස 10% පොළ බදු කොමිස් ගෙවීම | 3285.00 |
| 61 | කේ.සී.සංජීව මයා,සංවර්ධන නිළධාරි, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 අප්‍රේල් මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 4000.00 |
| 62 | වික්‍රම හාඩ්වෙයාර් ස්ටෝර්ස්(පුද්) සමාගම,මොරකැටිය පාර,පල්ලේගම,ඇඹිලිපිටිය | කටුවන ප්‍රාදේශීය සභාවේ කොම්පෝස්ට් ව්‍යාපෘතියට අවශ්‍ය පොහොර උර 1000 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම(ඒකක මිල රු.85.00) | 85000.00 |
| 63 | එච්.ජී.ඒ.සරත්චන්ද්‍ර මයා,වලස්මුල්ල පාර,කොහොලාන පාර,වලස්මුල්ල | PF-7414 කැබ් රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 23950.00 |
| 64 | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා,සුරාජ් මෝටර්ස් ඇන්ඩ් සර්විස්,වලස්මුල්ල පාර,කටුවන | PF-7414 කැබ් රථය වාර සේවා කිරීම වෙනුවෙන් ගෙවීම | 29630.00 |
| 65 | ඩී.බී.ජේ.පුෂ්පකුමාර මයා,ජනහිත මෝටර්ස් වලස්මුල්ල පාර,මිද්දෙනිය | RB-3498 ට්‍රැක්ටරය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම | 6600.00 |
| 66 | රෝහිණී අබේනායක මිය,කටුවන පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ අප්‍රේල් මස පැවති මහා සභාවට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම කිරීම<br>• චිකන් රයිස් 40-රු 18400.00<br>• රෝල්ස් 80-රු4800.00<br>• කෙසෙල් ගෙඩි 40-රු1600.00<br>• වීස් 40-රු2480.00<br>• ගස් කජු 1 kg -රු7000.00<br>• ක්‍රීම් ක්‍රැකර් පැකට් 02-රු720.00 | |

| | | | |
|---|---|---|---|
| | | • සර්වියට් පේපර් පැකට් 02-රු220.00<br>• වතුර බෝතල් 40-රු2400.00 | 37620.00 |
| 67 | ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන 03 ක් සඳහා ආදායම් බලපත්‍ර හා දුම් සහතික ලබා ගැනීම සඳහා ලබා ගත් අත්තිකාරම පියවීම | 19760.00 |
| 68 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | මිද්දෙනිය උතුර ජල පොම්පාගාරයේ ස්වයං ගිනි ගැනීමෙදී හානි වූ උපාංග ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 42244.00 |
| 69 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුලු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 2950.00 |
| 70 | සෝමසිරි ස්ටෝර්ස් (පුද්) සමාගම,රන්න පාර,අඟුණුකොළපැලැස්ස | කටුවන ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරයේ භාවිතය සඳහා 37.5 kg ප්‍රමාණයේ පිර වූ ගෑස් සිලින්ඩර් 05 ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 65315.00 |
| 71 | ජේ.ඒ.අනුර කුමාර මයා,අනුර හයිඩ්‍රොලික් ඇන්ඩ් සර්විස්,වීරකැටිය පාර,මිද්දෙනිය | ZA-2978 JCB යන්ත්‍රයේ හයිඩ්‍රොලික් හෝස් එකක් දැමීම සඳහා වැය වූ මුදල් ලබා ගැනීම | 6850.00 |
| 72 | කටුවන ගොවි සංවිධානය | කටුවන සති පොළෙහි වැහි පිලි සවි කිරී කර්මාන්තයේ 10% රැඳවුම් මුදල නිදහස් කිරීම | 76908.16 |
| 73 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | සුළු මුදල් අග්‍රිම ප්‍රතිපූරණය කිරීම | 24340.00 |
| 74 | මුදල් භාරකරු, කටුවන ප්‍රාදේශීය සභාව | 2022.05.24 දින පැවති සැලසුම් කමිටුවට අදාළ දීමනාව ගෙවීම | 6000.00 |
| 75 | ඩබ්.කේ.පියදාස මයා,මගවත්තරුප්ප,දංගලකන්ද,කටුවන | 2021 වර්ෂයට මිද්දෙනිය නව වෙළඳපොළ පොදු වැසිකිලියේ ටෙන්ඩරය ලබා ගැනීමෙදී තැන්පත් කරන ලද ටෙන්ඩර් ඇප තැන්පත් මුදල නිදහස් කිරීම | 2000.00 |
| 76 | ඩබ්.කේ.පියදාස මයා,මගවත්තරුප්ප,දංගලකන්ද,කටුවන | 2021 වර්ෂයට මිද්දෙනිය නව වෙළඳපොළ පොදු වැසිකිලියේ ටෙන්ඩරය ලබා ගැනීමෙදී තැන්පත් කරන ලද 25% ඇප තැන්පත් මුදල නිදහස් කිරීම | 3050.00 |
| 77 | එම්.කේ.ටී.චතුරිකා මිය,ආදායම් පරීක්ෂක, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මාර්තු මස පොළ අධීක්ෂණ දීමනාව ගෙවීම | 3000.00 |
| 78 | ඩබ්.ජී.දනිතා පුභාෂණි,සෝමසිරි ස්ටෝර්ස්,හුංගම පාර,මිද්දෙනිය | 2022 මැයි මස මිද්දෙනිය මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 7350.00 |
| 79 | ජේ.ඩිලාන් ,චන්ද්‍ර ස්ටෝර්ස්,මිද්දෙනිය පාර,කටුවන | 2022 අප්‍රේල් මස කටුවන මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 6550.00 |
| 80 | ඒන්.පී.ස්වර්ණා,පුවත්පත් නියෝජිත,කිරම | 2022 මැයි මස කිරම මහජන පුස්තකාලයේ පුවත්පත් බිල | 9460.00 |
| 81 | සාමාන්‍යාධිකාරී, සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ගබඩා කිරීම සඳහා ඇනවුම් අංක 1283-1289 දක්වා ඇනවුම් මගින් ලබා ගන්නා ලද ඉන්ධන සඳහා ගෙවීම කිරීම | 53000.00 |
| 82 | සාමාන්‍යාධිකාරී, සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය, වීරකැටිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු වාහන හා පොදු සේවා වෙනුවෙන් ගබඩා කිරීම සඳහා ඇනවුම් අංක 1290-1305 දක්වා ඇනවුම් මගින් ලබා ගන්නා ලද ඉන්ධන සඳහා ගෙවීම කිරීම | 261343.00 |
| 83 | මෙට්‍රො කම්පියුටර් ටෙක්නොලජී,අංක 02,කාලිදාස මාවත,මාතර | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය යන්ත්‍රයක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 8500.00 |
| 84 | චමිල් ඉංජිනියරින් ඇන්ඩ් වෙල්ඩින් වර්ක්ස්,මුරුංගස්යාය,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවට වීපී පහන් සකස් කිරීමට අවශ්‍ය හැඩල් නිර්මාණය කිරීම වෙනුවෙන් ගෙවීම | 18000.00 |

| | | | |
|---|---|---|---|
| 85 | දම්මික ට්‍රේඩ් සෙන්ටර්(පුද්) සමාගම,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කොම්පෝස්ට් ව්‍යාපෘතියට අවශ්‍ය එකක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 29990.00 |
| 86 | රෝහිණී අබේනායක මිය,කටුවන පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ මැයි මස පැවති මහා සභාවට සංග්‍රහ ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම කිරීම<br>• චිකන් රයිස් 40-රු 19200.00<br>• රෝල්ස් 70-රු4900.00<br>• කෙසෙල් ගෙඩි 40-රු1600.00<br>• විස් 40-රු2600.00<br>• ගස් කජු 1 kg -රු7000.00<br>• ක්‍රීම් ක්‍රැකර් පැකට් 02-රු560.00<br>• සර්වියට් පේපර් පැකට් 02-රු280.00<br>• වතුර බෝතල් 40-රු2400.00 | 38540.00 |
| 87 | එම්.දිනුෂික් රන්දුල මයා,ලේකම්, කටුවන ප්‍රාදේශීය සභාව | 2022 මැයි මස නිවාඩු දින වැටුප් ගෙවීම | 7760.00 |
| 88 | නිව් ඔස්මන් ඉලෙක්ට්‍රිකල්ස්,පළමු පටුමග,වීරකැටිය පාර,වලස්මුල්ල | මිද්දෙනිය බිබුල බලාගාරයේ හා තෝරකොළයාය ජළ බලාගාරවල පැනල් බෝඩ් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 8000.00 |
| 89 | ඩබ්.ඒ.චමින්දලාල්,චමින්ද ලී මෝල,මීමණකොළදෙණිය,කටුවන | කටුවන මාළු වෙළඳපොල කොන්ක්‍රීට් ඇතිරීම සඳහා අවශ්‍ය වැලි මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 161000.00 |
| 90 | ශෝන් කිල්ස් ඔෆිස් ඔටෝමේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්,යූනියන් පෙදෙස,කොළඹ 02 | කටුවන ප්‍රාදේශීය සභාව සතු Pc 065397 දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ (මිද්දෙනිය කාර්යාලයට අයත්) අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ගෙවිය යුතු ගිවිසුම්ගත මුදල ගෙවීම | 63708.97 |
| 91 | රත්නායක ටයර් හවුස්,වලස්මුල්ල පාර,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු RB-3498 අංක දරණ ට්‍රැක්ටරයට ටයර් යුගලයක් අළුතින් යෙදීම වෙනුවෙන් ගෙවීම කිරීම | 149000.00 |
| 92 | එල්.එල්.ඩී.දුල්ෂානි මිය,ලක්ෂාන් ඇඩ්වටයිසින්,වීරකැටිය පාර,මිද්දෙනිය | කිරම බස්නැවතුම්පොළ ඉදිරිපිට මාර්ගයේ කැඩීමට දැන්වීම් පුවරු දෙකක් (2"×2" ප්‍රමාණයේ)නිර්මාණය කිරීමට අදාළව ගෙවීම කිරීම | 23700.00 |
| 93 | චමිල් ඉංජිනියරින් ඇන්ඩ් වෙල්ඩින් වර්ක්ස්,මුරුංගස්යාය,මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අනවසර ස්ථානයන්හි කසළ බැහැර කිරීම වැලැක්වීම සඳහා ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය දැන්වීම් පුවරු සඳහා ආධාරක හා රාමු නිර්මාණය කිරීම සඳහා ගෙවීම් කිරීම | 180000.00 |
| 94 | ජී.පී.එච්.ප්‍රියන්ත,මහින්ද සයිකල් ස්ටෝර්ස්,ජනප්‍රිය බිල්ඩින්,වීරකැටිය පාර,මිද්දෙනිය | ප්‍රධාන ජල බලාගාරයට හා මිද්දෙනිය උතුර බලාගාරයට අළුත්වැඩියාවන් සඳහා අවශ්‍ය විදුලි උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම කිරීම | 30000.00 |
| 95 | එම්.ආර්.සෝමපාල,දයා සන්ස් ඇන්ඩ් හාඩ්වෙයාර් ස්ටෝර්ස්,වරාපිටිය පාර,වෙළඳගොඩ,කිරම | ඉන්ධන ගබඩා කර තබා ගැනීම සඳහා 200L බැරල් 04 ක් මිලදී ගැනීමට අදාල මුදල් ගෙවීම | 21600.00 |

ඉහත වවුචර් අංක 01 සිට 95 දක්වා වූ වවුචර් ගෙවීම කිරීමට සුදුසු බව මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේදී නිර්දේශ විය.

මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුවේ දී ඉදිරිපත් වූ යෝජනා පහත පරිදි වේ.

1) මෙම දිනවල පවත්නා වර්ෂාව හේතුවෙන් සෞඛ්‍ය අංශය,ජල අංශය වැනි අත්‍යාවශ්‍ය සේවා අංශවල කටයුතු කරන කටුවන ප්‍රාදේශීය සභාවේ කිරම උප කාර්යාලයේ සේවයේ නියතු අයි.ජී.මංජුල, බී.දයාසේන, කේ.ඩී.චතුරංග යන අයට වැහි කබා 03 ක් සහ සපත්තු කුට්ටම 02 ක්ද,2021 වර්ෂයේ ආදේශක පත්වීම් ලබා දුන් සේවක මහත්වරුන් සඳහා ද වැහිකබා සහ සපත්තු ලබා දීමට සුදුසු යැයි යෝජනා විය.
2) කිරම නව බස්නැවතුම්පොළ කඩ කාමර දුන් අයගේ ගිවිසුම් කඩිනමින් අත්සන් කිරීමට යෝජනා විය.
3) කිරම නගරයේ ස්ථාපනය කර ඇති ධීවර අලෙවිසැල ඩී.කේ.ධම්මික සමග ගිවිසුම් කඩිනමින් අත්සන් කිරීමට යෝජනා විය.
4) රට තුළ පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් පිරවුම්හලින් ඉන්ධන ලබා ගත හැකි අවස්ථාවන්වලදී කටුවන ප්‍රාදේශීය සභාවේ ගබඩාව වෙත ඉන්ධන ගබඩා කර තබා ගැනීම සඳහා ප්ලාස්ටික් බැරල් 04 ක් මිලදී ගැනීමට යෝජනා විය.
5) කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල බලාගාරවල රු.25000.00 හා ඊට අඩු අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය උපකරණ (තාක්ෂණ නිළධාරී වාර්තා සහිත)මිල ගණන් කැඳවීමකින් තොරව ගෙවීම සිදු කිරීමට යෝජනා විය.
6) කටුවන ප්‍රාදේශීය සභාවේ මිද්දෙනිය උප කාර්යාලයේ පවතින 065397 අංක දරණ ඡායා පිටපත් යන්ත්‍රයේ අළුත්වැඩියා කිරීමට අදාල ඇස්තමේන්තුවට අදාල ගෙවීම සහා අරමුදලින් ගෙවීමට සුදුසු බව යෝජනා විය

ගරු ප්‍රා.ස.ම. ඊ.බී.ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව අංක 01 සිට 95 දක්වා වූ වවුචර් ගෙවීම සම්බන්ධවත් 01 සිට 06 දක්වා විවෘධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රිවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 2. මාසික වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව - 2022 මැයි මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

2022 වර්ෂයේ මැයි මස මහ සභාව සතු සියළු වෙළඳ පොළවල් , මිද්දෙනිය පොළ තුළ පිහිටි වෙළඳ කුටිවලින් හා මිද්දෙනිය පැරණි පොළ මාළු ලැලි මගින් රු.350800.00ක් ලබා ඇති අතර , පොළ ආදායමෙන් මෙම මස 10% කොමිස් මුදල් හා පොළ ව්‍යාපෘති දීමනා වෙනුවෙන් රු. 43105.00 ක මුදලක් දරා ඇති බැවින් ශුද්ධ ආදායම රු.307695.00 ක් වන අතර මෙම වෙළඳපොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඩබ්.ඩී.එම්.බී.හරිස්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මැයි මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවෘධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රිවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 – 3. යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2022 මැයි මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව සතු යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් 2022 මැයි මස හා වාහන අභ්‍යන්තර සහ බාහිර (කුලී පදනම මත) වැඩ කටයුතු සිදු කිරීමෙන් රු:120600.00ක ආදායමක් ලබා ඇත. යන්ත්‍ර අලුත්වැඩියාව ,රියදුරු වැටුප්, ඉන්ධන ආදී කටයුතු වෙනුවෙන් රු: 284543.60 ක වියදමක් දරා ඇත. ඒ අනුව යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මගින් රු: 163943.60 ක අලාභයක් ලබා ඇති අතර මැයි මාසයට අදාළ යන්ත්‍රෝපකරණ ව්‍යාපෘති වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ජී.ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මැයි මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>06 – 4 .ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව - 2022 මැයි</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

සභාව සතු යන්ත්‍රෝපකරණ හා වාහන සඳහා මැයි මස රු.493218.00 ක ඉන්ධන සපයා ඇත. මෙම ඉන්ධන වියදම් වාර්තා සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මැයි මස ඉන්ධන වියදම් වාර්තාව සම්බන්ධව විවාධිත අදහස් නොමැති බැවින් සියලූ මන්ත්‍රීතුමන්ලාගේ එකගතාවය මත සභා සම්මත කරන ලදී.

**<u>06 - 5 .ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව - 2022 මාර්තු සහ අප්‍රේල් මස</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022 මාර්තු මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 3072257.68ක් වන අතර මාසික වියදම රු.3740294.05ක් වේ. ඒ අනුව මාසික අලාභය රු: 668036.37 කි. එසේම 2022 අප්‍රේල් මාසයට අදාළ ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව අනුව සමස්ත ආදායම රු: 2263223.36ක් වන අතර මාසික වියදම රු.724108.00ක් වේ. ඒ අනුව මාසික ලාභය රු: 1539115.36කි. ඒ අනුව මාර්තු සහ අප්‍රේල් මාසයන්ට අදාළ ජල විශ්ලේෂණ වාර්තා සභාවේ අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම එම්.පී.සී.කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, මාර්තු මාසයට අදාළව ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාවේ අලාභයක් සිද්ධ වෙලා තියෙනවා. ඒකට හේතුව වෙන්න ඇත්තේ මෙහි සඳහන් වෙනවා ජල මීටර් මිලදී ගැනීමක් පිළිබඳව. නමුත් ඒ පිළිබඳව මෙහි විස්තරයක් සඳහන් වෙනවා නම් හොඳයි.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

ඔව්. අක්‍රිය ජල මීටර් සඳහා සවි කරන්න අවශ්‍ය නිසා අපි ජල මීටර් මිලදී ගත්තා. ඒ මුදලට ගත්ත නිසා යම් ලාභයක් තියෙනවා. දැනට මිල ගණන් විශාල ලෙස වැඩි වෙලා. එත් එක්කම මෙම ජල මීටර් මිලදී ගැනීම අපි සභාවට ඉදිරිපත් කරලා අනුමැතිය ලබා ගත්තා. එම වවුචර් පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් දෙන්න පුළුවන්.

ඒ අනුව 2022 මාර්තු සහ අප්‍රේල් යන මාස වල ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තා සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**<u>06 - 6. ජල ව්‍යාපෘතියේ මාසික ජල හිඟය අඩු වැඩි වීම -2022 අප්‍රේල් සහ මැයි මස</u>**

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

කටුවන ප්‍රාදේශීය සභාව සතු ජල ව්‍යාපෘතියට අදාළව මාසික ලැබීම් සහ හිඟ මුදල් සම්බන්ධව වාර්තාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2022 මාර්තු මස වන විට ආරම්භක හිඟය රු: 8951926.97 ක් වන අතර මාර්තු මස අවසාන හිඟය රු: 8913430.97ක් වේ. ඒ අනුව හිඟයේ වෙනස රු: 38496.00කි.

එසේම 2022 අප්‍රේල් මස වන විට ආරම්භක හිගය රු: 8913430.97 ක් වන අතර අප්‍රේල් මස අවසාන හිගය රු: 8853877.97ක් වේ. ඒ අනුව හිගයේ වෙනස රු: 59553.00කි. මෙම වාර්තාව සභා සම්මත කර ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම.ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මෙම වාර්තාවේ හැටියට පසුගිය අප්‍රේල් මාසය අවසාන වන විට හිගය රු. 8853877.97ක් තියෙනවා. පසුගිය දිනවල අපි මිද්දෙනිය පුරාණ විහාරස්ථානය සමග සාකච්ඡාවක් මගින් එහි ජල හිගය පියවා ගන්න තීරණය කළා. එම ගැටළුව මේ වන විට විසඳිලා නැද්ද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

දැනට අපි ගරු සනත් මන්ත්‍රීතුමන් ගේ වැටුපෙන් අයවන කොටස් සහ ගාමිණී ජයවික්‍රම මන්ත්‍රීතුමන්ගේ මාසික වැටුපක් අයකර ගෙන තියෙනවා. නමුත් පන්සලේ නායක ස්වාමීන් වහන්සේ කියූ මුදල් අයවීමක් වුනේ නැහැ. ඒ බව නැවත දන්වා යවලා විසඳුමක් නොමැති වුණොත් අපිට තීරණයක් ගන්න වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා</u>

එහෙම කරනවා නම් සියලු ආයතන වලට ඒ විදියට කරන්න. සියලු රාජ්‍ය ආයතන වල හිග ශේෂයන් බලලා විසන්ධි කිරීමකට යනවා නම් හොඳයි.

<u>ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමා</u>

පෞද්ගලික පාරිභෝගිකයින් තමන්ම බිල ගෙවන නිසා පිරිමැස්මෙන් ජලය පරිහරනය කළත් මේ රාජ්‍ය ආයතන වල රජයෙන් බිල ගෙවන නිසා පිරිමැස්මක් නැහැ. ඒ නිසා ජල බිල විශාල ලෙස වැඩිවෙනවා. මේ සඳහා විසඳුමකට යන්න වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. ඊ.බී. ඉන්දික මැතිතුමා</u>

සභාපතිතුමණි, පොලිසියෙත් හිග බිලක් තියෙනවා නම් ඒකත් විසන්ධි කිරීමකට යන්න පුළුවන් නේද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

පොලිසිය සම්බන්ධ බිල් වල ගැටළුවක් තියෙනවා. අපිට ඒ හිගයන් පවතින්නේ මොන කාල වකවානු වලද කියලා පෙන්නන්න ලිඛිත සාක්ෂි නැහැ. සමහර විට පොලිසියේ ගොඩනැගිලි සකස් කරන කාලේ ඒ කොන්ත්‍රාත් කරුවන් විසින් ලබා ගත් ජලය සඳහා නොගෙවූ බිල් වෙන්නත් පුළුවන්. ඒ නිසා අපිට හරියටම සාක්ෂියක් දෙන්න බැරිව අයකර ගැනීම අපහසු වෙලා තියෙනවා. එවැනි ගැටළුත් මේ සම්බන්ධයෙන් තියෙනවා.

ඒ අනුව ජල ව්‍යාපෘතියේ 2022 මාර්තු සහ අප්‍රේල් මස මාසික ජල හිගය අඩු වැඩි වීමේ වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 - 7. කර්මාන්ත කමිටු වාර්තාව- 2022.06.10 දින</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා</u>

2022.06.10 දින පැවති පහත කර්මාන්ත කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙදින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේදී ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 ට අදාළව පහත මාර්ග කර්මාන්ත කමිටුව විසින් පරීක්ෂා කරන ලදී.

01. අවරවලගේන මාර්ගය කැටගල් අල්ලා සංවර්ධනය කිරීම LA/09/21/BP/262

02. ප්‍රජා ශාලාව මාර්ගය කැට ගල් අල්ලා සංවර්ධනය කිරීම LA/09/21/BP/235

එම මාර්ග වල මුදල් ලැබී ඇති බැවින් අදාළ කර්මාන්ත වල ගෙවීම කිරීම සුදුසු බව මෙදින පැවති කමිටුව තීරණය කරන ලදී.

තවද 2021 සභා අරමුදල් මගින් ක්‍රියාත්මක කරන ලද පහත කර්මාන්ත වල රැඳවුම් කාල සීමාව ඉක්මවා ගොස් ඇති බැවින් අදාළ රැඳවුම් නිදහස් කිරීම සුදුසු බවද කමිටුව නිගමනය කරන ලදී.

03.වඩුමුල්ල හරහා මහවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

04.අඹගහගේන කරමැටිය මාවතගේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.06.10 දිනැති කර්මාන්ත කමිටු වාර්තාව සම්බන්ධව විවාධික අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 07. බැංකු සැසඳුම්, ප්‍රා.ස 07 වාර්ථා

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා**

සභාව මගින් පවත්වාගෙන යනු ලබන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස.07 ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් පිළිබද මාසික ප්‍රකාශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- බැංකු සැසඳුම් වාර්තා.
  1. 265-1-001-7-7876593- ජල ව්‍යාපෘති ගිණුම
  2. 0077187171- මෙහෙයුම් හා තැඩත්තු ගිණුම
  3. 0072633606- කර්මාන්ත ගිණුම
  4. 265-1-001-3-0020439- සේවක ණය ගිණුම
  5. 265-1-001-9-7876587- පොදු අරමුදල් ගිණුම
  6. 265-1-001-2-7876595- පොළ ව්‍යාපෘති ගිණුම
- 2022 මාර්තු මස ප්‍රා.ස. 14 ,16 ,07 වාර්තා

ගරු ප්‍රා.ස.ම. කේ.සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 මැයි මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රාස 14,16 වාර්තා සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08. වෙනත් යෝජනා

**08-1. මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා කඩ කාමර හා දෙවන මහල සම්බන්ධවයි**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා කඩ කාමර හා දෙවන මහල සම්බන්ධවයි මැයෙන් කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම් මහතා විසින් 2022.06.21 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව බෙලිගල්ල, ඉහළ බෙලිගල්ල, වලව්වත්ත ලිපිනයෙහි පදිංචි විජේසිරි කුලතුංග මයා වෙත මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා කඩ කාමර හා දෙවන මහල බද්දු දීම සම්බන්ධයෙන් පවතින ගැටළු කිහිපයක් පෙන්වා දී ඇත. මේ සම්බන්ධයෙන් විගණන වාර්තා වල සදහන්ව ඇති බැවින් ඒ බව දන්වා එම ගැටළු පිළිබද සාකච්ඡා කර තීරණයක් ලබා ගැනීම සදහා එම පාර්ශවය සමග පහත සංයුතියෙන් සැදුමලත් කමිටුවක් පත් කර ඒ සදහා නිශ්චිත දිනයක් යොදා සාකච්ඡාවක් කැදවීම සුදුසු යයි යෝජනා කරමි

01.ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා

02.ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණි මැතිතුමා

03. ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා

04. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා

05.කටුවන ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා

06.ආදායම් පරීක්ෂක නිලධාරීන් දෙදෙනෙක්

07. තාක්ෂණ නිලධාරි තුමා

08. විෂය නිළධාරි

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඒච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

පසුගිය විගණන පරීක්ෂණ වාර්තා වල මෙම කඩ කාමර බද්දු දීම සම්බන්ධව විමසීමක් කරලා තියෙනවා. ඔම පිළිබද අපි නිතර කථා කරනවා. තවමත් ඒ අවශ්‍ය ඉදිකිරීම සිදුවෙන්නේ නැහැ. සභාවට ගෙවිය යුතු බද්ද කුලී ගෙවමින් කඩ කාමර ටික තියෙනවා. ඒකෙන් ජනතාවට සේවයක් වෙන්නේ නැහැ. අපි නැවතත් මේ පාර්ශවයත් සමග අපේ කමිටුවක් පත් කරලා සාකච්ඡාවක් කරමු. එහෙම විසඳුමක් ලබා ගන්න බලමු.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේක ලොකු පාඩුවක්. නගරයේ දියුණුවට හානියක්. වෙන කාට හෝ මේ කඩ කාමර ටික දිලා අපිට නගරයේ දියුණුව වගේම ජනතාවට සේවය කරන්න පුළුවන් අවස්ථාවක් මේකෙන් මග හැරෙනවා. උඩ කඩ කාමර ජරාවාස වෙලා තියෙන්නේ. මේ සදහා ඉක්මණින් විසදුමක් ගන්න කටයුතු කරන්න.

ඒ අනුව බෙලිගල්ල, ඉහළ බෙලිගල්ල, වලව්වත්ත ලිපිනයෙහි පදිංචි විජේසිරි කුලතුංග මයා වෙත මිද්දෙනිය රාජපක්ෂ සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 සිට 25 දක්වා කඩ කාමර හා දෙවන මහල බද්දු දීම සම්බන්ධයෙන් පවතින ගැටළු විගණන වාර්තා වල සදහන්ව ඇති බැවින් ඒ බව දන්වා එම ගැටළු පිළිබද සාකච්ඡා කර තීරණයක් ලබා ගැනීම සදහා එම පාර්ශවය සමග කමිටුවක් පත් කර ඒ සදහා නිශ්චිත දිනයක් යොදා සාකච්ඡාවක් කැදවීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඡන්දතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-2. වරිපණම් ප්‍රතිශෝධන කටයුතු සදහා සහභාගී වීම වෙනුවෙන් දීමනාවක් ලබා දීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

වරිපනම් ප්‍රතිශෝධන කටයුතු සදහා සහභාගී වීම වෙනුවෙන් දීමනාවක් ලබාදීම මැයෙන් අංක කප්‍රාස 02 හා 2022.06.16 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ වරිපණම් ප්‍රතිශෝධන කටයුතු සදහා 2020 සැප්තැම්බර් මස සිට කටයුතු කරන ජී. ආර් රශ්මි රවීනා මෙයට පළාත් පාලන කොමසාරිස්ගේ අංක 01/03/06/03 හා 2021.12.27 දිනැති ලිපියෙන් රු. 1600.00ක

දෛනික දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා දී ඇති බව දන්වා ඇත. ඒ අනුව ඇය විසින් 2022 පෙබරවාරි මස 28 දින සිට 2022 මැයි 31 දින දක්වා සේවය කරන ලද දින 87ක් සඳහා රු. 139200.00ක මුදලක් සභා අරමුදලින් ගෙවීම සුදුසු බවත් වරිපනම් ප්‍රතිශෝධන කටයුතු අවසන් වූ පසුව ජල අංශයේ කටයුතු සඳහා මේ අය යොදා ගැනීම සුදුසු බවත් යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>

මේ සඳහා අපි කලින්නුත් ගෙවීම් කළා නේද?

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

ඔව්. වැඩ කරන දින ගණන අනුව තමයි ගෙවීම සිදු කරන්නේ. මේ වරිපනම් සක්සේරු කටයුතු දැනට අවසන් වෙමින් තියෙන්නේ. ඒ කටයුතු වලින් අනතුරුව අපිට ජල බිල් පරිගණකයට ඇතුළත් කිරීම් ආදි කටයුතු සඳහා මේ අය යොදවා ගන්න පුළුවන්. පසුගිය කාලයේ ඒ කටයුතු සිදුකළ සේවිකාව ඉල්ලා අස්වීම නිසා එම කටයුතු වල සිදු වූ ප්‍රමාද වීම් යථාවත් කිරීමට මේ අය යොදා ගමු.

ඒ අනුව කටුවන ප්‍රාදේශීය සභාවේ වරිපනම් ප්‍රතිශෝධන කටයුතු සඳහා 2020 සැප්තැම්බර් මස සිට කටයුතු කරන ජී. ආර් රශ්මි රවීනා මෙයට පළාත් පාලන කොමසාරිස්ගේ අංක 01/03/06/03 හා 2021.12.27 දිනැති ලිපියෙන් රු. 1600.00ක දෛනික දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා දී ඇති බැවින් ඇය විසින් 2022 පෙබරවාරි මස 28 දින සිට 2022 මැයි 31 දින දක්වා සේවය කරන ලද දින 87ක් සඳහා රු. 139200.00ක මුදලක් සභා අරමුදලින් ගෙවීම සම්බන්ධවත් වරිපනම් ප්‍රතිශෝධන කටයුතු අවසන් වූ පසුව ජල අංශයේ කටයුතු සඳහා මේ අය යොදා ගැනීම සම්බන්ධවත් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-3 උපකරණ මිලදී ගැනීම</u>

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

මුදල් අයකැමි ස්ථානය සඳහා අවශ්‍ය භාණ්ඩ ඉල්ලා සිටීම මැයෙන් 2022.06.20 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව මුදල් අයකැමි ස්ථානය සඳහා කබඩ් එකක් සහ මේසයක් සැපයුම් ආයතන මගින් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු බවත් වානේ අල්මාරියක් මිලදී ගැනීම මැයෙන් අංක කප්‍රාස 30 හා 2022.06.20 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව සහ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය සඳහා වානේ අල්මාරියක් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.ම . ටී.බී. ඉන්දික මැතිතුමා.</u>

මේ අවශ්‍ය භාණ්ඩ මිල කැඳවීම් කරලා අරගෙන දෙමු.

ඒ අනුව මුදල් අයකැමි ස්ථානය සඳහා කබඩ් එකක් සහ මේසයක් සහ සහ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය සඳහා වානේ අල්මාරියක් මිල කැඳවීම් කර සභා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධව විරුද්ධ අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08- 4 .ඉන්ධන සඳහා ඇප තැන්පත් මුදලක් ලබා දීම</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

වීරකැටිය , සීමාසහිත විවිධ සේවා සමුපාකාර සමිතිය මගින් අංක හ/278 හා 2022.06.17 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් 2022.06.15 දින සිට ඉන්ධන ලබා ගැනීමේදී මුදල් ගෙවා ඉන්ධන ලබා ගත යුතුව ඇති බැවින් අප ආයතනය මගින් මිලදී

ගනු ලබන ඉන්ධන වටිනාකමට සරිලන පරිදි ප්‍රමාණවත් ඉන්ධන ඇප තැන්පත් මුදලක් ලබා දීමට හෝ කඩිනමින් අයවිය යුතු ඉන්ධන ණය ගැනි මුදල් ගෙවන ලෙස දන්වා ඇත. ඒ අනුව එම ආයතනය වෙත රුපියල් ලක්ෂ දහයක ( රු. 1000000.00) ඇප තැන්පතුවක් තැන්පත් කර ඉන්ධන ලබා ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. එච්.ඒ.ගාමිණි සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

__ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.__

අපි යකල් ලබා ගන්නා ඉන්ධන පිරවුම් හලට ඇප තැන්පතුවක් ලබා දීම හොඳයි. ඒ අය ඉන්ධන ලබා ගන්න මුලින් ගෙවීම් කළ යුතු නිසා තමයි මෙ යෝජනාව කරලා තියෙන්නේ. කොහොම වුණත් එහෙම ඇප තැනපතුවක් තියෙද්දී අපිට අනිවාර්යෙන්ම ඉන්ධන ලබා ගන්න පුළුවන්. ඒ නිසා රු. ලක්ෂ දහයක පමණ ඇප තැන්පතුවක් තැන්පත් කරමු.

__ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා__

මෙ මුදල අපි ඉන්ධන ලබා ගන්න ප්‍රමාණය අනුව වෙනස් වෙනවද?

__ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.__

එහෙම වුණොත් ඒ අය අපිට දන්වාවි. අපේ වාහන මෙ දිනවල ධාවනය අඩු නිසා ඉන්ධන සඳහා යන වියදම අඩුයි. එහෙම නැත්නම් මීට වඩා විශාල මුදලක් ඉන්ධන සඳහා වැය වෙනවා.

ඒ අනුව වීරකැටිය , සීමාසහිත විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් රුපියල් ලක්ෂ දහයක ( රු. 1000000.00) ඇප තැන්පතුවක් තැන්පත් කර ඉන්ධන ලබා ගැනීම සම්බන්ධව විරුධිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

__08-5. ගබඩාව සඳහා භාණ්ඩ ලබා ගැනීම__

__ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.__

භාණ්ඩ ලබා ගැනිම සඳහා මැයෙන් ගබඩා භාරකරු කේ.පී රුමේෂ් මයා විසින් 2022.06.21 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව ගබඩාව වෙත ඉල්ලුම් කර ඇති පහත ලිපි ද්‍රව්‍ය සැපයුම් ආයතන මගින් මිල කැදවීම් කර සහා අරමුදලින් මිලදී ගැනීම සුදුසු යයි යෝජනා කරමි.

01.photo paper පැකට් - 10

02.2" බයින්ඩින් ටේප්(කළු) – 20

03.Box File (pocket සහිත) -20

04.ගම් බෝතල් - 20

05.permanent marker pen – 10

06. CR පිටු 160 පොත් - 50

07. White board marker pen - 10

08. 2" Bonder tape – 20

09.CR පිටු 40 පොත් - 20

10.කතුරු - 20

11. calculator – 20

12.ෆයිල් කවු පැකට් - 10

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ජ්.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ජ්.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>

මෙම අවශ්‍ය ද්‍රව්‍ය ඉක්මණින් මිල කැඳවීම් කරලා අරගෙන දෙමු.

ඒ අනුව ගබඩාව වෙත ඉල්ලුම කර ඇති ලිපි ද්‍රව්‍ය සැපයුම් ආයතන මගින් මිල කැඳවීම කර සහා අරමුදලින් මිලදී ගැනීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-6. යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතියට අදාළව හිග මුදල් අය කර ගැනීම සම්බන්ධව</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතියට අදාළව හිග මුදල් අයකර ගැනීම සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 19 හා 2022.06.20 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව 2021.12.31 වන දිනට කවුටන ප්‍රාදේශිය සභාව වෙත අයවිය යුතු හිග කුලී ආදායම ලෙස රු. 770040.44 ක මුදලක් අදාළ පාර්ශවයන්ගෙන් අයකර නොගැනීම සම්බන්ධව 2021 වර්ෂයට අදාලව සිදුකරන ලද විගණන පරීක්ෂන වලදී විගණනයට ලක්ව ඇත. එහිදී ගිවිසුම් සොයා ගැනීමට හැකි පුද්ගලයන්ගෙන් එම මුදල් අයකර ගැනීමට අදාළ නීතිමය කටයුතු සිදු කිරීමට මූලික පියවර ගැනීමට කටයුතු සිදුකරනු ලබන අතර දැනට එසේ නිශ්චිත තොරතුරු අනාවරණය කර ගත නොහැකි එනම් මෝටර් ග්‍රේඩරය, බැකෝ යන්ත්‍රය, රෝලර් යන්ත්‍රය ආදියෙහි ගිවිසුම් හා ධාවන සටහන් තොරතුරු නොමැති හා රාජ්‍ය ආයතන නමින් පවතින ශේෂයන් සම්බන්ධයෙන් තීරණයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇත. ඒ අනුව දැනට ගිවිසුම් පවතින අයගෙන් ඒ මත පදනම්ව මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සුදුසු බවත් තොරතුරු තවදුරටත් සොයා ගැනීමක් ලෙස මැෂින් ක්‍රියාකරවන්නන් සමග සාකච්ඡාවක් සිදුකර අවශ්‍ය තොරතුරු අනාවරණය කරගෙන අයකර ගැනීමට හැකි උපරිම මුදල් ශේෂයන් අයකර ගැනීම සුදුසු බවත් ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරි සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බවත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.පී.නිශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මෙම සම්බන්ධයෙන් අපිට නිශ්චිත වශයෙන් තොරතුරු ඉදිරිපත් කරන්න නැහැ. නමුත් අපි මැෂින් ක්‍රියාකරවන්නන් සමග සාකච්ඡාවක් මගින් තොරතුරු ටිකක් අනාවරණය කරගතහොත් මේ ඇතැම් කොන්ත්‍රාත්කරුවන් දැනටත් ඒ කටයුතු වල නිරත වන නිසා අපිට අය කර ගැනීම පහසු වේවි.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී.හරිශ්චන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මෙම කාරණය සම්බන්ධයෙන් කථා කරද්දී අපිට ජල බිල් හිගය සම්බන්ධයෙන් පවතින ප්‍රශ්නයත් මේකට සමාන කරන්න පුළුවන්. මොකද මේ මුදල් අපිට නිශ්චිතව ලිඛිත සාක්ෂි නොමැති කමින් යම් හෙයකින් අත් හරින්න අවසර දෙනවා නම් අපිට ජනතාව පැත්තෙන් නිශ්චිත සාක්ෂි නොමැති හිග මුදල් අත් හරින්න පුළුවන් වෙන්න ඕන. ඇතැම් රාජ්‍ය ආයතන වලට ඒ සහනය ලබා දෙනවා නම් ජනතාවට කොහොමත් දෙන්න ඕන. ඒත් එක්කම කියන්න ඕන මේ

කාරණය සම්බන්ධයෙන් 2012 වර්ෂයේ සිට එන ශේෂයන් විගණනයට යොමු වෙලා තියෙන්නේ වර්තමානයේදී. අපි මෙතෙක් සභාව තුළ මෙම කාරණය සාකච්ඡාවට බඳුන් කළේ නැහැ. ඒ සැඟවීම හෝ වැරැද්ද සිදු වුණේ කොතනින්ද? කෙසේ නමුත් අපිට මේ මුදල් ටිකක් හෝ අය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන්න ඕන.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

මේ සම්බන්ධයෙන් මෙපමණ කල් විගණන පරීක්ෂණ තියලත් 2012 තරම් පරණ සිදුවීම් මේ වර්ෂයේදීත් විගණනය කිරීම ප්‍රශ්නයක් තමයි. මේ කාල සීමාවත් සමග අපිට ඇතැම් තොරතුරු සොයා ගැනීමේ අපහසුවක් පවතිනවා. සමහර විට ආසන්න කාලයේම මේ දේවල් සම්බන්ධව ක්‍රියාත්මක වුණා නම් අපිට අය කර ගැනීම් පහසු වෙනවා.

<u>ගරු ප්‍රා.ස.ම. කේ.එච්.ජී. ආනන්ද කුලසුන්දර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මම හිතන්නේ මේ කාරණයේදී එවකට හිටපු නිලධාරීන් තමන්ගේ රාජකාරිය නිසි අයුරින් නොකිරීමක් අපි දකිනවා. මොකද යම් කාර්යයක් කරන විට ඒ සඳහා විධානය ගරු සභාපතිතුමන් ලබා දුන්නත් නිසි නිසි ක්‍රමවේදයට ගිවිසුම් අත්සන් කරලා, මුදල් අයකරගෙන , නිවැරදි විස්තර සහිතව මේ යන්ත්‍ර උපකරණ ලබා දීම නිලධාරීන්ගේ වගකීමක් . ඒ සඳහා ගරු සභාපතිතුමන්ට දෝෂාරෝපණය කිරීමේ ඵලක් නැහැ. මේ සම්බන්ධයෙන් එවකට සිටි නිලධාරීන්ට , සමහර විට ගරු සභාවට පවා අධිභාර වීමක් වෙන්න පුළුවන්. ඒ නිසා මේ සම්බන්ධව කඩිනමින් අවශ්‍ය තොරතුරු සොයා ගැනීමට මැදිහත් වෙන්න කියලා මම ගරු සභාපතිතුමන්ට යෝජනා කරනවා. මේ අකටයුත්ත කෙසේ හෝ අය කර ගැනීමකින් හෝ අත් හැරීමකින් විසඳුමක් ලබා ගත්තත් ඉදිරියට එවන් අකටයුතු නොවෙන්න අපි කටයුතු කරන්න ඕන. ඒ සඳහා ගරු සභාපතිතුමන්, ලේකම්තුමන් මැදිහත්ව නිලධාරීන් දැනුවත් කරන්න ඕන. එය කඩිනමින් කරලා ඉදිරියේදී මෙවන් ආකාරයට සභාවට ලැබිය යුතු ආදායම් අහිමි නොකරන්න වගේම එය නිලධාරීන්ට, සභාපතිතුමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට අධිභාරයක් නොවෙන්න කටයුතු සිදු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ අනුව යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතියට අදාළව හිග මුදල් අයකර ගැනීමේදී දැනට ගිවිසුම් පවතින අයගෙන් ඒ මත පදනම්ව මුදල් අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධවත් තොරතුරු තවදුරටත් සොයා ගැනීමක් ලෙස මැෂින් ක්‍රියාකරවන්නන් සමග සාකච්ඡාවක් සිදුකර තොරතුරු අනාවරණය කරගෙන අයකර ගැනීමට හැකි උපරිම මුදල් ශේෂයන් අයකර ගැනීම සම්බන්ධවත්, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරි සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධවත් විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-07. 2022.05.05 වන දින W.O කරුණාසේන මහතාගේ ඉල්ලීම් ලිපිය සම්බන්ධවයි</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

2022.05.05 වන දින W.O. කරුණාසේන මහතාගේ ඉල්ලීම ලිපිය සම්බන්ධවයි මැයෙන් අංක කප්‍රාස 19 හා 2022.06.21 දිනැතිව ඉදිරිපත් කර ඇති ලිපියට අනුව කටුවන ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතියට අදාළව W.O කරුණාසේන මහතා විසින් 2018 වර්ෂයේදී ටිපර් රථය දිනක් සඳහා රු.8000.00ක මුදලකටද රෝලර් යන්ත්‍රය රු. 7000.00 ක මුදලකටද ගිවිසුම් ගතව රැගෙන ගොස් ඇති අතර ඔහු විසින් ටිපර් රථයට දින 07ක් සඳහා රු.110000.00ක්ද රෝලර් යන්ත්‍රයට දින 15ක් සඳහා රු.105000.00 ක් ද ගෙවා ඇති අතර ඔහු විසින් රු. 89681.00ක හිග මුදලක් සභාව වෙත තවදුරටත් ගෙවිය යුතු අතර මෙහි නතර කර තිබූ කාලය සඳහාද ගිවිසුම අනුව මුදල් අය කර ඇති බැවින් ඒ සඳහා අදාළ පාර්ශවය විසින් සහනයක් ඉල්ලා ඇති බව සඳහන් කර ඇත. නමුත් මෙහි ගිවිසුම

ප්‍රකාරව ගණනය කිරීම් සිදු කර ඇති බැවින් එම අදාල මුදල් අය කිරීම සදහා නව දුරටත් උත්සාහ කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රා.ස.ම. ටී.බී. ඉන්දික මැතිතුමා.**

සභාපතිතුමණි, ඒ වාහන වල වැඩ නොකරපු කාලය අපිට නිශ්චිතව කියන්න පුළුවන්ද? ඒ කාලය තුළ අදාල වාහන වල යතුරු භාර දීම කළාද?

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි සාමාන්‍යයෙන් යතුරු භාර දීමක් කරන්නෙ නැහැ. වැඩ නොකරන කාලය තුළ අදාළ රියදුරු මහතුන් මෙහෙ තමයි හිටියේ. ඒත් එක්කම දෛනික ධාවන සටහන් වල මේ බව සදහන් වෙනවා. මේ ඉල්ලීම සාධාරණයි. මොකද වර්ෂාව නිසා සහ ABC නොමැති නිසා දින 19ක් රෝලර් යන්ත්‍රය නවතා තිබූ බව අපේ සටහන් වල තියෙනවා. නමුත් ගිවිසුම අනුව නවතා තිබූ දිනක් සදහාද යම් මුදලක් අය කිරීමට එකග වී ඇති බැවින් අපිට මේ මුදල් අත් හරින්න බැහැ.

**ගරු ප්‍රා.ස.ම. එච්.කේ.ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා.**

මේ සම්බන්ධයෙන් අපිට අධිභාර වීමක් සිදුවෙන්නේ නැද්ද?

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

එහෙම වෙන්න විදියක් නැහැ. මොකද ගිවිසුමේ සදහන් කොන්දේසි වලට එකග වෙලා ගිවිසුම් අත්සන් කරලා තමයි මේ වාහන ගෙනිහින් තියෙන්නේ.

ඒ අනුව කටුවන ප්‍රාදේශීය සභාවට අයත් යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතියට අදාලව W.O කරුණාසේන මහතා විසින් රු. 89681.00ක හිග මුදලක් සභාව වෙත ගෙවීම සම්බන්ධව සහනයක් ඉල්ලා සිටීමට අදාළව මෙහි ගිවිසුම් ප්‍රකාරව ගණනය කිරීම සිදු කර ඇති බැවින් එම අදාළ මුදල් අය කිරීම සඳහා නව දුරටත් උත්සාහ කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**08-08. වවුචර් සදහා ගෙවීම් කිරීම**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ පහත වවුචර් සදහා කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

01.වවුචර් අංක 465 - සමරසිංහ මෙටල් ක්‍රෂර්ස්, කලාව කාරියමඩිත්ත - කටුවන නව මහජන පොළ භූමියේ කොන්ක්‍රීට් ඇතිරීම සදහා අවශ්‍ය ABC ගල් කියුබ් 14.1ක් මිලදී ගැනීම -රු.119850.00

02. වවුචර් අංක 422 - ඩබ්.ඒ. චමින්ද ලාල් , චමින්ද ලී මෝල, මීමණකොළදෙනිය , කටුවන - කටුවන මාළු වෙළදපොළ කොන්ක්‍රීට් ඇතිරීම සදහා අවශ්‍ය වැලි මිලදී ගැනීම - රු.161000.00

03. වවුචර් අංක 457 - ජී.එල්. සංජීවනී ගුණසේකර- කටුවන නව මහජන පොළ භූමියේ කොන්ක්‍රීට් ඇතිරීමට අවශ්‍ය සිමින්ති ගැනීම කොට්ට 90ක් ලබා ගැනීම- රු.247500.00

04. වවුචර් අංක 473 - ශානිකා ටයර් හවුස්,මිද්දෙනිය පාර, වීරකැටිය.- PF 7414 අංක දරන නිළ රථයට 265/70/16 ප්‍රමාණයේ ටයර් 4ක් යෙදීම - රු. 301200.00

05.වවුචර් අංක 478 - වමිල් ඉංජිනියරින් ඇන්ඩ් වෙල්ඩින් වර්ක්ස්, මුරුංගස්යාය, මිද්දෙනිය - බල ප්‍රදේශයේ අනවසර ස්ථානයන්හි කසළ බැහැර කිරීම වැළැක්වීම සඳහා ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය දැන්වීම් පුවරු සකස් කිරීම - 180000.00

06. වවුචර් අංක 466 - මුණසිංහ ගල් මෝල ,වීරසිංහ මාවත, අතුබෝඳෙ, වලස්මුල්ල- කටුවන නව මහජන පොළ භූමියේ කොන්ක්‍රීට් ඇතිරීම සඳහා කොන්ක්‍රීට් ගල් කියුබ් 6.4ක් මිලදී ගැනීම - රු. 57600.00

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ජ්.පී. නිශාන්ත කුමාර මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී. අපි ඒ වවුචර් සඳහා ඉක්මණින් ගෙවීම් කරමු.

ඒ අනුව මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ වවුචර් සඳහා කඩිනමින් ගෙවීම් කළ යුතු බැවින් පරීක්ෂා කර බලා ගෙවීම් කිරීම සියළු මන්ත්‍රීවරුන්ගේ ඒකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-09. රථ වාහන නැවතුම් බද්ද අය කිරීම සම්බන්ධවයි</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

රථවාහන නැවතුම් බද්ද අය කිරීම සම්බන්ධවයි මැයෙන් 2022 වර්ෂයේ මිද්දෙනිය රථවාහන නැවතුම් බද්ද අය කිරීමේ ටෙන්ඩරය ලබා දී ඇති මිද්දෙනිය ශ්‍රී මහින්ද නාහිමි මාවතේ , සිතාරා ලිපිනයෙහි පදිංචි ජේ.ඒ. අනුර මයා විසින් රට තුළ පවතින ඉන්ධන අර්බුධය හේතුවෙන් මිද්දෙනිය නගරය වෙත රථ වාහන පැමිණීම විශාල ලෙස අඩු වී ඇති බැවින් 2022 අප්‍රේල් මාසය සඳහා ආදායමක් නොලැබීම හේතු කරගෙන සහනයක් ලබා දෙන ලෙස සිදුකර ඇති ඉල්ලීමට අනුව ටෙන්ඩර් බද්ද මුදලින් 25%ක් අඩු කර අයකර ගැනීම සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලබා ගන්නා ලෙස 2022.04.21 මහ සභාවේ තීරණ අංක 08-05 යටතේ තීරණය කර තිබුණි. නමුත් එහි මුදල නිශ්චිත ලෙස සඳහන්ව නොමැති බැවින් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභාව වෙත අයවිය යුතු මුදල් අත් හැරීම යටතේ 2022 අප්‍රේල් මාසය සඳහා අයකරනු ලබන වාරික මුදල වන රු. 12890.05 ක මුදලින් රු. 9667.54ක මුදලක් අය කිරීමටත් 25% ක මුදල වන රු. 3222.51ක මුදලක් අත්හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය සඳහා යොමු කිරීම සුදුසු බව යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා යෝජනාව ස්ථිර කරන ලදී. අපි ඒ සහනය ලබා දෙන්න කටයුතු කරමු.

ඒ අනුව 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශිය සභාව වෙත අයවිය යුතු මුදල් අත් හැරීම යටතේ 2022 අප්‍රේල් මාසය සඳහා රථ වාහන නැවතුම් බද්ද අය කිරීම සම්බන්ධයෙන් එහි මාසික ටෙන්ඩර් බද්ද මුදල වන රු. 12890.05 ක මුදලින් රු. 9667.54ක මුදලක් අය කිරීමටත් 25% ක මුදල වන රු. 3222.51ක මුදලක් අත්හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය සඳහා යොමු කිරීම සම්බන්ධව විවාදික අදහස් නොවූ බැවින් සියලු මන්ත්‍රීවරුන්ගේ ඒකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08-10. නොපැමිණි මන්ත්‍රීවරුන් සඳහා නිවාඩු අනුමත කිරීම - ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා</u>

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-11. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම රමනි හල්පෙ ගමගේ මැතිතුමිය ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙගමගේ මැතිතුමිය ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-12. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම ප්‍රදීපා නිසංසලා මැතිතුමිය ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමියට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. එම්.ඩී.සුගතදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-13. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම කේ.රන්ජන් වීරසේකර මැතිතුමා ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. කේ.රන්ජන් වීරසේකර මැතිතුමන් ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. බී.රාජපක්ෂ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-14. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම කේ.එච්.චන්ද්‍රසේන මැතිතුමා ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගි වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. කේ.එච්. චන්ද්‍රසේන මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. එන්.ජී.එස්.වීරසිරි මැතිතුමියගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08-15. නොපැමිණි මන්ත්‍රීවරුන් සදහා නිවාඩු අනුමත කිරීම - ගරු ප්‍රා.ස.ම සුගත් සරඹගේ මැතිතුමා

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප තත්ත්වයන් මත සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි බව ගරු ප්‍රා.ස.ම. සුගත් සරබගේ මැතිතුමා ලිඛිතව දන්වා ඇත. ඒ අනුව ගරු මන්ත්‍රීතුමන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රා.ස.ම. එච්.ඒ.ගාමිණී සංජීව මැතිතුමන්ගේ ස්ථිරත්වයෙන් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**09.ප්‍රගතිය සාකච්ඡා කිරීම**

**ගරු ප්‍රා.ස.මන්ත්‍රී එම්.ඩී.සුගතදාස මැතිතුමා**

ගරු සභාපතිතුමණි, දැනට රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් රජය විසින් චක්‍රලේඛ එවීම හේතුකරගෙන සභාවක් විදියට අපිට යම් යම් කර්මාන්ත වල කටයුතු සිදු කිරීම නවත්වන්න වගේම සංවර්ධන කටයුතු සිදුකිරීම නතර කරන්න වෙලා තියෙනවා. මොකද මේ මූල්‍ය කළමණාකරණය කිරීම හේතුවෙන්. කෙසේ නමුත් එමගින් යම් යම් පිරිස් සදහා අසාධාරණයක් සිදුවෙන්න පුළුවන්. ඒ කියන්නේ කිරම කඩ කාමර සකස් කරලා දෙන්න අපි යම් යම් පාර්ශව සදහා පොරොන්දු වුණා. ඒ අයට ඒවා සකස් කර නොදීමෙන් යම් අසාධාරණයක් සිදුවෙනවා වගේම එයින් ගරු සභාපතිතුමන්ද අපහසුතාවයට පත් වෙනවා. මේ සදහා යෝජනාවක් විදයට ඒ අයගේ මුදල් ලබා ගෙන හරි ඒවා ඉදිකර ගන්න අවස්ථාවක් දෙන වැඩපිළිවෙළක් සකස් කරලා දෙනවා නම් හොදයි. ඒ කියන්නේ අපි සකස් කරන ලද ඇස්තමේන්තු යටතේ අපේ තාක්ෂණ නිළධාරී මහතුන්ගේ අධීක්ෂණය යටතේ ඒ අයගේ මුදල් වලින් සකස් කර ගැනීමක් වගේ වැඩ පිළිවෙළක් සිදු කරමු.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ඔව්, අපිට එවැනි වැඩ පිළිවෙළකට යන්න පුළුවන්. දැනට කිරම කඩ කාමර සකස් කරන්න හදපු ඇස්තමේන්තු අනුමැතිය සදහා හම්බන්තොට යවලා තියෙනවා. මිල අනුපාත වල වෙනස් වීම හේතුවෙන් තමයි පරක්කු වෙලා තියෙන්නේ. අපි ඒ ඇස්තමේන්තු අනුමත වෙලා ආවහම ඒ ඉංජිනේරු මහතුන් සමග කථා කරලා බලමු. අපිට හදන්න ප්‍රතිපාදන නැත්නම් අපි ඒ අයගෙන් කීමණී මුදල් හරි ලබා ගෙන මේ කඩ කාමර සකස් කරලා දෙමු.

**ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා.**

ගරු සභාපතිතුමණි, අපිට මේ රාජපක්ෂ සුපිරි වෙළද සංකීර්ණයේ තුමා ස්ටිකර් ආයතනය සම්බන්ධ ගැටළුවේදි සභාවක් විදයට ඒ පාර්ශවය සදහා කරන්න පුළුවන් බලපෑම අඩු වෙලා තියෙනවා. නමුත් බදු කුලී කොහොම ගෙව්වත් මේ ගොඩනැගිල්ල තුළ සංවර්ධනයක් වෙන්නේ නැතිව ජනතාවට සේවයක් වෙන්නේ නැහැ. ඒ සදහා සුදුසු තීරණයක් ගන්න අවශ්‍යයි.

**. ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි මේ කඩ කාමර ඒ අය සදහා ලබා දෙන්න ගිවිසුම් ඇතිකර ගෙන තියෙන්නේ තිස් අවුරුදු ගිවිසුමක් යටතේ නිසා තමයි මේ ගැටළුව. අපි ඒ අය සමග කථා කරලා සුදුසු ක්‍රියා මාර්ගයක් ගනිමු.

**ගරු ප්‍රා.ස.ම.එච්.කේ.ඒ. ආනන්ද කුලසුන්දර මැතිතුමා.**

ඒත් එක්කම මේ දිනවල තියන ඉන්ධන අර්බුධය පිළිබදව කථා කරද්දි අපි ගුරුවරුන් විදියට සිසු දරු දැරියන් ගැන හිතලා මේ දින දෙක තුළ පාසල් පවත්වන්න ලොකු වෙහෙසක් ගත්තා. තියන ඉන්ධන ප්‍රමාණය පිරිමසා ගෙන කටයුතු කළත් අද වන විට ගුරුවරුන් බහුතරයකට පාසලට එන්න විදියක් නැතිව පාසල් නිවාඩු දෙන්න තීරණය කරන්න වුණා. ඉන්දන පිරවුම්හල් වල ඉන්ධන ටිකක් ලබා ගන්න පුළුවන් වාතාවරණයක් අද වන විට නැහැ. ගුරුවරු , වෛද්‍යවරු පවා නොයකා පිරවුම්හල් ළග බලපුළුවන් කාරනම් මත තෙල් ගන්නා පිරිස් ඇතිවෙලා. අඩුම කරමේ පොලිස් නිළධාරියෙකුට පවා නීතියට වැඩ කරන්න විදියක් නැති වෙලා. අපිට සභාවක් විදියට මෙවන් තත්වයක් තුළ ආරක්ෂක අංශය සමග එක්ව ගමක එක් එක් පාර්ශව සදහා ඉන්ධන අවශ්‍ය පරිදි ලබා දීමට ක්‍රමවේදයක් සකස්

කරන්න ඉහළ දේශපාලන අධිකාරියට යෝජනා කරන්න පුළුවන්. ඔබතුමන්ලා මේ සඳහා මැදිහත් වෙන්න කියලා යෝජනා කරනාවා.

<u>ගරු ප්‍රා.ස.ම. පී.කොඩිතුවක්කු මැතිතුමා.</u>

ගරු සභාපතිතුමණි, මේ ඉන්ධන ලබා ගැනීමේ ගැටළුවේදී මතුවන තවත් ප්‍රශ්නයක් තමයි මේ ප්‍රදේශ වලට පිටින් එන අය ඉන්ධන ලබා ගැනීම හේතුවෙන් අපිට ඒ අවස්ථා නොලැබී යනවා. අපි පොලිස් ස්ථාන දෙක දැනුවත් කරලා මේ ඉන්ධන පෝළිම් වල ඉන්න අයගේ හැඳුනුම්පත් පරීක්ෂා කරලා අනන්‍යතාවය තහවුරු කර ගෙන ඉන්ධන ලබා දෙන්න කියලා යෝජනා කරමු.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආරියරත්න ඒකනායක මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, මේ ඉන්ධන ප්‍රශ්නය අද පහළම ස්ථානයේ අර්බුධයක් බවට පත් වෙලා තියෙන්නේ ඉහළ නිළධාරීන් හා පාලකයින් මේ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් නොකළ නිසා. අත්‍යවශ්‍ය සේවා විදියට රජය සෞඛ්‍ය , අධ්‍යාපන අංශ නම් කළත් ඒ අයට ඉන්ධන දෙන්න ක්‍රමවේදයක් හැදුවේ නැහැ. තෙල් පෝළිම් වල ඉඳල තමයි දෙමව්පියන් ළමයි පාසලට අරගෙන යන්නේ . ඒ අයටත් තෙල් අවශ්‍යයි. ඊට පස්සේ රජය තීරණයක් ගත්තා නගරබද පාසල් වහලා ගම්බද පාසල් පවත්වන්න. ඒ සඳහාත් දුර බැහැර ඉඳල එන ගුරුවරු එන්නේ කොහොමද? එතකොට ළමයින්ට උගන්නන්නේ කවුද? මේ සඳහා කිසිම ක්‍රමවේදයක් නැතිව මේ තීරණ අරගෙන හරියන්නේ නැහැ. ඒ නිසා අපි සියලු දෙනා එක්ව සුදුසු වැඩ පිළිවෙළක් යෝජනා කරන්න ඕන.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.එච්.ඒ.සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, අපි සභාවක් විදියට මැදිහත් වෙලා මෙ මිද්දෙනිය නගරයේ තියන ත්‍රිවිල් රථ ගාල, වාහන රථ ගාල, අත්‍යවශ්‍ය රාජකාරි සඳහා ඉන්ධන ලබා ගන්න ක්‍රමවේදයක් හදන්න ඕන. එහිදී එක ඉන්ධන පිරවුම් හලක් නම් කරලා මේ අත්‍යවශ්‍ය අයට තෙල් ගන්න ක්‍රමයක් සකස් කරනවා නම් මේ ගැටළුව විසඳෙනවා. මොකද පසුගිය කාලය තුළ මිද්දෙනිය නගරයට ඇවිත් තියන තෙල් විශාල වශයෙන් නගරයෙන් පිටත පුද්ගලයින් තමයි අරගෙන ගියේ.

ඒත් එක්කම සභාපතිතුමණි, රණවිරු උයන ඇවිදින මංතීරුවෙහි තාම පිළිසකර කිරීමක් සිදු කරලා නැහැ. අපිට ඒ සඳහා කුමක් හෝ දෙයක් කරන්න පුළුවන්ද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

ඒක ඒ පාර්ශවය විසින් කරන බව කිව්ව නිසා තමයි අපි මැදිහත් නොවුණේ. අපිට ලොකු වියදමක් කරන්න බැරිවෙයි. නමුත් කඩා වැටුණු පස් ටික හරි ඉවත් කරලා දෙන්න තමයි බැලුවේ.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී අයි.කේ.සුසන්ත පද්ම තිලක් මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, යශෝව මගින් පවත්වන පෙර පාසල් වල ගුරුවරුන්ටත් ඉන්ධන අර්බුධය නිසා එන්න අපහසුයි. ඒත් එක්කම පෙර පාසල් වල ළමයින්ටත් ඒ ගැටළුව තියෙනවා. මේ ප්‍රශ්නය නිසා පෙර පාසල් පවත්වන දින ගණන දින කිහිපයකට සීමා කිරීමක් කරනවද?

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි එහෙම කරන්න අවශ්‍ය නැහැ. සෑම පෙර පාසලකම ඉන්නෙ අවට ගුරුවරු. එහෙම තමයි අනුයුක්ත කරලා තියෙන්නේ. පෙර පාසල් වලට ළමයි එන්නෙ අවටින්. ඒ අයට පයින් වුනත් එන්න පුළුවන්. ළමයින්ට උගන්නන්න තියන අවස්ථාව නැති කරන්න අවශ්‍ය නැහැ. දිගටම පෙර පාසල් පැවැත්වීම සුදුසුයි.

<u>ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඩබ්.ඩී.එම්.ඩී.හරිස්චන්ද්‍ර මැතිතුමා</u>

ගරු සභාපතිතුමණි, දැනට පවතින ඉන්ධන අර්බුධය හමුවේ අපි සියලු දෙනාම විශාල ලෙස අපහසුතාවයට පත් වෙලා තියෙනවා. ඉන්ධන බෙදා හරින ආයතනයක වැඩ කරන කෙනෙක් විදියට මම මේ පිළිබඳ යම් පැහැදිලි කිරීමක් කරන්න ඕන. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ දෛනික අවශ්‍යතාවය ඩීසල් මෙට්‍රික් ටොන් 7000ක් පමණ සහ පෙට්‍රල් මෙට්‍රික් ටොන් 5000ක් පමණ තමයි යන්නේ. මීට පෙර අවශ්‍යතාවය මේ ආකාරයට වුණත් අද වන විට එය 2000කින් පමණ වැඩි වෙලා තියෙනවා. ඒත්

එක්කම අපි මාතර තෙල් ගබඩාවෙන් වෙනදා තෙල් ලෝඩ් 60ක් පමණ යැව්වත් දැන් හය 6-7ක් දක්වා අඩු වෙලා තියෙනවා. ඒ කියන්නේ ලංකාවේ තෙල් සැපයුම සහ ගබඩා කර ඇති ප්‍රමාණය පැහැදිලිව අඩු වෙලා තියෙනවා. කෙසේ නමුත් මිද්දෙනිය නගරයේ ඉන්ධන පිරවුම් හල් තුනට ඊයෙ තෙල් ලීටර් 24000ක් , පෙරේදා ලීටර් 19800ක් , කලින්දා ලීටර් 13200 වශයෙන් ඉන්ධන ලබා දුන්නත් පෝලිම් සිටීම තුළින් කියන්න තියෙන්නේ මිනිසුන් තෙල් අසීමිත ලෙස ගබඩා කිරීම නිසා මේ අර්බුධය ඇති වන බව තමයි. අනෙක් කාරණය පෙට්‍රල් සම්බන්ධයෙන් ගත්තහම ඉන්ධන පිරවුම් හල් වල තෙල් මාෆියාවක් තියෙනවා. යම් බලය අතට ගත් පිරිසක් මේ කාර්යය හරියට කරන්න නොදී අනවශ්‍ය විදියට ඉන්ධන ලබා දීම තුළින් පෝලිම් වල ඉන්න අයට තෙල් ටික ගන්න බැරි වෙලා තියෙනවා. සමහර විට ආරක්ෂක අංශයත් මේ අයට පක්ෂපාතී වෙනවා ඇති. ඒ නිසා අපි මේ අය දැනුවත් කරන්න ඕන ආරක්ෂක අංශය සෘජුවම පක්ෂග්‍රාහී නොවී මේ කාර්යයට මැදිහත් වනවා නම් අපිට මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්.

ඒත් එක්කම ජනමාධ්‍ය හා ගෝල්ෆේස් අරගල වලින් නිළධාරීන්ගේ වටිනාකම නැති කරලා තියෙනවා. මිනිස්සු නිළ ඇඳුමට වත් ගරු නොකරන තත්වයක් උදාවෙලා. මිනිස්සු සිවිල් නීතිය අතට ගත් විට මේ තත්වය පාලනය කරන්න අමාරුයි. අපිට මේ තෙල් අර්බුධයට විසඳුමක් විදියට අත්‍යවශ්‍ය සේවා සඳහා තෙල් ලබා ගන්න ඉන්ධන පිරවුම් හලක් නම් කර ගත්තොත් ඒ සඳහා තෙල් ලබා ගන්න පුළුවන් වෙයි. ඉඩ පහසුකම් හා ඉන්ධන ගබඩා කර ගන්න පුළුවන් තැනක් ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තුමන්, පොලිස් ස්ථානාධිපතිතුමන් සහ ඔබතුමන් මැදිහත් වෙලා ඒ කටයුත්ත කරන්න.

අනෙක් කාරණය විදියට අපේ සභාව මගින් විදි පහන් අක්‍රිය කිරීම කරද්දී එය ආරක්ෂිත ක්‍රමවේද අනුව සිදු කිරීම පිළිබඳ සතුටු වෙනවා. අපි ජනතාවගේ ආරක්ෂාව ගැන හිතන්න ඕන. ඒත් එක්කම අපේ ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්ත වල වැඩ කරන අය රාත්‍රී කාලයේ රාජකාරි සඳහා යන නිසා විදිලාම්පු තියනවා නම් හොඳයි. ඒ ගැනත් අවධානය යොමු කරන්න.

අනෙක් කාරණය අපි අද කථා කළ විදියට යම් යම් කර්මාන්ත ආදිය සිදු කිරීමේදී ඒවා නිසි ක්‍රමවේදයට සිදු නොකිරීමෙන් නිළධාරීන් මෙන්ම ගරු සභාවත් යන දෙපාර්ශවයම අපහසු තාවයට පත් වන නිසා ඒ කටයුතු ක්‍රමවත්ව ගිවිසුම් ගතව සිදු කිරීමට නිළධාරීන්ව දැනුවත් කරන්න කියලා ඉල්ලීම කරනවා . ස්තූතියි.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

වර්තමානය වන විට ඇති වෙලා තියන මේ තත්වයට හේතුව අරගල භූමිය තුළින් තමයි ආරම්භ කළේ. මුලින්ම ජනාධිපති ලේකම් කාර්යාලය වහලා එතන දේපල විනාශ කරන්න මිනිස්සු පටන් ගත්තම, ජනතාව සිවිල් නීතිය අතට ගත්තම ඒක පාලනය කරන්න අමාරුයි. ගම් වල මිනිස්සු දේපල විනාශ කරන්න, වාහන ගිනි තියලා විනාශ කරන්න පටන් ගත්තා. දැන් ඒ කාර්යය තමයි ඉන්ධන පිරවුම් හල් ළඟ කියෙන්නේ. ඒක මාෆියාවක් වෙලා තියෙන්නේ. රටේ සිවිල් නීතිය නැතිවෙලා. රටේ ගරුත්වයක් තියන කෙනෙකුට , වෛද්‍යවරයෙකුට ඉන්ධන ටිකක් ලබා ගන්න බැරිවෙලා. ඒත් එක්කම ජනතාවට පොදු ප්‍රවාහනය දැනට පවතින නිසා රාජකාරියට යන්න, පාසලට යන්න අවශ්‍ය නම් පුළුවන්. එකට පෞද්ගලික වාහනම අවශ්‍ය නැහැ. ඒ සංස්කෘතිය සම්පූර්ණ වෙනස් වෙලා. අපි වෛද්‍යවරයෙකුට තෙල් ටිකක් ලබා ගන්න අවස්ථාව දෙන්න ඕන. ඔය පෝලිම් වල ඉන්න මිනිස්සුන්ට යම් දෙයක් වුණොත් අපිට යන්න වෙන්නේ එතනට තමයි. අද වැඩිහිටියන්ට, උගතුන්ට නොසළකන තරුණ පිරිසක් බිහිවෙලා. අපි මේ සඳහා එක් එක් අයට වැරැද්ද කියන්න අවශ්‍ය නැහැ. අපි සියලු දෙනා එක්ව තම තමන්ගේ පාක්ෂිකයින් හිතවතුන් දැනුවත් කරලා මේ රට මුලින් තිබූ තත්වයට ගේන්න සියලූ දෙනා ඇප කැප වී ක්‍රියා කරමු යයි යෝජනා කරනවා.

## <u>10. - ස්තූතිය හා නිමාව.</u>

අද දින 2022 වර්ෂයේ ජුනි මස මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා සම්බන්ධ වුන හිටපු ගරු සභාපතිතුමන් , ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා සහ ලේකම්තුමා,

' නිලධාරීතුමිය, ඇතුළු සියළුම දෙනාට ස්තූතිවන්ත වෙමින් අද දවසෙ සභාවෙ වැඩ කටයුතු මෙතනින් අවසන් කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව 01.30 ට පමණ සභා කොමෝ සතුටින් විසිර ගියහ.

.............................

අයි. ජී. මහින්ද,

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.

අයි.ජී.මහින්ද
සභාපති
කටුවන ප්‍රාදේශීය සභාව
මිද්දෙණිය